# බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අගෝස්තු 09 දිනද ,ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011මැයි13 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 20 දින සභාවේ සභාපති වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

සභාපති වරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.45,677,561 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.205,969 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.351,676 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනයන්හි අගයන් හා අයවැය ගත අගයන් සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක 25% සිට 459% දක්වාද ,වියදම් වැය විෂයයන් 06 ක 63% සිට 1187% දක්වාද විචලනයන් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 890 | 178 | 712 |
| (ii) | බදු කුලී | 190 | 2,411 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 719 | 613 | 106 |
| (iv) | වෙනත් ආදායම් | 1,264 | 1,665 | - |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත්සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 460,832 |
| (ii) | මුද්දර ගාස්තු | 960,969 |

### 2.3.3. බදු ආදායම්

(අ) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2008 වර්ෂයේදී ඉදිකරන ලද බඩල්කුඹුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 16 ක් අදාල අවබෝධතා ගිවිසුම ප්‍රකාරව සභාවේ දේපලක් වශයෙන් පවරාගෙන නොතිබුණ අතර 2012 අගෝස්තු 15 දින දක්වා කඩ කාමර බදු දීමට කටයුතු නොකර වසා දමා තිබුණි.

(ආ) නක්කල සති පොල සහ කඩ කාමර 05 කින් දීර්ඝ කාලයක සිට අයවිය යුතු කඩ කාමර කුලී රු.97,068 ක මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) බඩල්කුඹුර ගවමස් කඩයෙහි 2011 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී රු.113,375 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

**2.4 නිෂ්ක්‍රීය භෞතික සම්පත්**

රු.307,000 ක් වටිනාකමට වූ වාහන ,යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ නිෂ්ක්‍රියව පවතින බව භෞතික සම්පත් පිළිබඳව තියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

(අ) 2006 අප්‍රේල් 10, 2006 මැයි 26, 2006 අගෝස්තු 01 හා 2007 අගෝස්තු 01 දිනැති පිළිවෙලින් අංක 28, 28 (1) හා 28 (ii) හා 36 දරන කලමනාකරණ සේවා චක්‍රලේඛ වලට හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1)(i) වගන්තිය ප්‍රකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් නොමැතිව අනියම් සෞඛ්‍ය කම්කරුවන් 05 දෙනෙකු ද පුස්තකාල භාරකරුවන් 03 දෙනෙකුද පරිගණක ක්‍රියාකාරිණියක් හා යතුරු ලේඛිකාවක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.635,500 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) බඩල්කුඹුර පශු එන්නත්කරුට ජලභීතිකා එන්නත් ක්‍රියාත්මක කරන මාසයට පමණක් රු.1,500 ක ඉන්ධන දීමනාවක් ගෙවීමට පළාත් පාලන කොමසාරිස්ගේ 2010 අගෝස්තු 26 දිනැති අංක 12/ආ/15/ප්‍රපා/09 දරන ලිපියෙන් අනුමැතිය ලබා දී තිබුණ ද ඊට පටහැනිව 2010 සැප්තැම්බර් සිට 2011 අගෝස්තු දක්වා වර්ෂයක කාලයක් සඳහා රු.18,000 ක් ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) සහ (ඔ) වගන්ති ප්‍රකාරව අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා නොගෙන අවස්ථා 07 කදී රු.46,388 ක ශුභසාධන වියදම් දරා තිබුණි.

**2.6 අවිධිමත් ගනුදෙනු**

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 සහ ඊට අදාල අත් පොතේ 2.14.1 වගන්තිය අනුව යටත් පිරිසෙන් මිල ගණන් 05 ක් ලබා ගත යුතු වුවද මිල ගණන් 03 ක් පමණක් ලබාගෙන රු. 222,395 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ආ) මොනරාගල දිස්ත්‍රික් පේෂකර්ම කාර්යාලයේ සේවය කරනු ලබන සේවකයකුට 2009 පෙබරවාරි සිට 2011 දෙසැම්බර් 31 දක්වා ප්‍රාදේශීය සභාව මඟින් වැටුප් හා දීමනා රු.635,495 ක් ගෙවා තිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලකවරුන් 03 දෙනෙකු විසන් ක්ෂේත්‍රයේ රැස්කරන ලද රු.151,677 ක මුදලක් කාර්යාලයට භාරදීමේ දී දින 6 -30 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් රු.1,919,831 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.1,813,414 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.22,581,570 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2006 වර්ෂයේ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.33,473 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු නොකර ආදායමින් කපා හැර තිබුණි.

(ඉ) 2011 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.36,726 ක සෘණ අගයක් විය.

(ඊ) අවස්ථාවන් 05 කදී තිකත් කරනු ලැබූ අතුරු අග්‍රිම රු.72,800 ක මුදලක් පියවීමට කටයුතු කර නොතිබුණි

(උ) රු. 141,940 ක් වූ මිලදී ගැනීම් ඉන්වෙන්ට්‍රි/ තොග ලේඛනවලට ඇතුලත් කර නොතිබුණි.

(ඌ) 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූන ගෙවිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.814,346 ක් විය.

(එ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 203 ප්‍රකාරව සභාවේ දේපළ සම්බන්ධයෙන් පූර්ණ සමීක්ෂණයක් හා 214 රීතිය ප්‍රකාර ගබඩා ද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි.

3. පද්ධති හා පාලන
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂෙත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය